## දර්ශනය

අප රට ආර්ථිකයෙහි සියලුම අංශවලට අදාලව ප්‍රමිතිකරණය සහ තත්ත්වය වැඩි දියුණු කිරීමේ කාර්යයන් ඉටු කරමින් ජාතික ජීවන තත්ත්වය නංවාලීම පිණිස නායකත්වය ලබාදෙන්නාවූ අග්‍රගණ්‍ය ජාතික සංවිධානයක් බවට පත්වීමය. මෙම ආයතනයේ සේවා නියුක්තීන්ගේ හා සේවාලාභීන්ගේ සිතුම් පැතුම් සපුරාලන ස්වයං අභිප්‍රේරිත සංවිධාන සංස්කෘතියකින් හෙබි විශිෂ්ඨත්වයේ ප්‍රතිමූර්තියක් වීමය.

## මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ ජාතික ආර්ථිකයේ සියලුම අංශවල ප්‍රමිතිකරණය, මිනුම්, තත්ත්ව ස්ථාපනය සහ ආශ්‍රිත කාර්යයන් ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසු කිරීම තුලින්,

- සම්පත් පරිහරණය උපරිම කිරීම
- ඵලදායිතාව නැංවීම අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම පහසු කිරීම
- සමාජ-ආර්ථික සංවර්ධනය ලඟා කර ගැනීම.
- භාණ්ඩ හා සේවාවන් ගේ අන්තර්ජාතික තරඟකාරීත්වය වර්ධනය කිරීම.
- පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ ආයතනයේ සේවාදායකයින්ගේ සේවා-ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සංවිධානය

විද්‍යා හා තාක්ෂණ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් ප්‍රමිති ආයතනයේ සභාපති සහ මහා මණ්ඩලය ද ආයතනයේ විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලබයි. අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වරුන් දෙදෙනෙක් ද, ඒ ඒ අංශ භාර අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකු ද සිටිති. අධ්‍යක්ෂවරුන් යටතේ සහකාර අධ්‍යක්ෂවරුන් ද ප්‍රමිති නිලධාරීන් සහ පරීක්ෂණ නිලධාරීන් ද කටයුතු කරයි. මීට අමතරව ඉහත නිලධාරීන්ගේ කටයුතු සඳහා ආධාරක කාර්ය මණ්ඩලයක් ද ඇත.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ස්ථානයේ පිහිටා ඇත.

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි කාර්යභාරය

- භාණ්ඩ හා සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර සම්පාදනය - ඔබගේ භාණ්ඩයට ජාතික (ශ්‍රී ලංකා) හෝ සමාගම් පිරිවිතර සම්පාදනය කරවාගන්න. පවත්නා ප්‍රමිතීන් ප්‍රතිශෝධනය/ අලුත් කරවා ගැනීමට ඉල්ලුම් කරන්න.

- ප්‍රමිතිකරණය හා තත්ත්ව කලමනාකරණය පිළිබඳ තොරතුරු සැපයීම

- භාණ්ඩ පරීක්ෂාව (ද්‍රව්‍ය, විදුලි, ආහාර, රසායනික, රෙදිපිළි, ක්ෂුද්‍ර ජීවී යනාදිය) - දේශීය හෝ විදේශීය හෝ ප්‍රමිති පිරිවිතරවලට අනුකූලව හෝ මෙහිදී භාණ්ඩ පරීක්ෂා කරවා ගත හැක.

- මිනුම් උපකරණ ක්‍රමාංකනය - ඔබගේ මිනුම් උපකරණ නිවැරදි පාඨාංක දක්වන්නේ දැයි පරීක්ෂා කරවාගෙන වැරදි නම් නිවැරදි කරවාගන්න.

- තත්ත්ව කළමනාකරණ පුහුණුව (මූලික තත්ත්ව සංකල්ප, තත්ත්ව කව, තත්ත්ව කළමනාකරණ ඩිප්ලෝමා, තත්ත්ව උපදේශක සංවර්ධන වැඩසටහන් යන පාඨමාලා ආදිය) - කලින් සැලසුම් කළ පොදු පාඨමාලා වලට සහභාගි විය හැක. එමෙන්ම ඔබේ ආයතනයෙහි අවශ්‍යතාවයන් ට අනුකූලවන පරිදි විශේෂයෙන් සැකසුණු පුහුණු පාඨමාලා ඔබ ආයතනයෙහි දී ම පවත්වා ගැනීමට ද හැක.

- පද්ධති සහතිකකරණය - ඔබගේ ආයතනයේ ක්‍රියා පද්ධතිය මෙම ප්‍රමිතිවලට අනුකූල බවට සහතික කරවාගෙන ඔබගේ හැකියාවන් පාරිභෝගිකයන්ට හඬහා පවසන්න. (ISO 9001, ISO 14001, HACCP, OHSAS 18001, GMP, SA 8000)

- විදුලි උපකරණවල ශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණය -
ඔබගේ භාණ්ඩය ශක්ති පරිභෝජනය අතින් කාර්යක්ෂම බැව් පාරිභෝගිකයන්ට ඒත්තු ගන්වන්න.

- භාණ්ඩ සහතිකකරණය (SLS) - ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර වලට අනුකූල වන බවට භාණ්ඩ සහතික කරවාගෙන පාරිභෝගික විශ්වාසය දිනාගන්න.

- ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මානය - මෙම සම්මානය සඳහා අයැදුම් කරන සෑම ආයතනයකටම අගැයුම් වාර්තාවක් නිකුත් කෙරේ. එමගින් ඔබේ ව්‍යාපාරය කොතැනද එහි ක්‍රියාකාරිත්වය කෙබඳුදැයි වටහා ගන්න. සම්මානලාභීන් හැර අනෙකුත් අයැදුම් කරුවන්ගේ නම් හෙළි කරනු නොලැබේ.

- භාණ්ඩ සඳහා පූර්ව අපනයන පරීක්ෂාව - අපනයනයට පෙර ඔබගේ භාණ්ඩ ප්‍රමිතිවලට අනුකූල බවට දැක්වෙන සහතිකයක් ලබා ගන්න.

- ආනයන පරීක්ෂා ක්‍රමය

- අපනයනය පිණිස මුහුදු ආහාර ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන ලියා පදිංචි කිරීම